දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary } 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50, **Fax**: 2784846

ඊමේල්/ -மெயில்/E-mail : isurupaya@moe.gov.lk

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**கல்வி அமைச்சு**

**Ministry of Education**

"ඉසුරුපාය" , ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
'இசுருபாயா' ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No } ........................................

මගේ අංකය / எமது இல. / My No. } ED/1/1/5/7

දිනය / திகதி / Date } 2015. 03. 23

**චක්‍රලේඛ අංකය: 2015 / 14**

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සහ
විදුහල්පතිවරුන් වෙත

**සංස්කෘතික කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය හා ටවර් හෝල් රංගහල පදනම ඒකාබද්ධව මෙහෙයවනු ලබන සමස්ත ලංකා පාසල් නාට්‍ය තරගය - 2015**

01. අරමුණ හා හැඳින්වීම :

1:1 ගුණාත්මක නාට්‍ය හා රංගකලා සංස්කෘතියක් බිහිකිරීම සහ ප්‍රවර්ධනයට දායකවීම.

1:2 පාසල් ප්‍රජාවගේ නිර්මාණශීලීත්වය, පෞරුෂ වර්ධනය, සමාජයීය එකමුතුව, සහජීවනය, විනයගරුක බව නායකත්වය හා රසඥතාව පුබුදුවාලමින් සහ නාට්‍ය හා රංගකලාව ආශ්‍රයෙන් දැනුම, ආකල්ප හා කුසලතා ප්‍රවර්ධනය කරමින් යහපත් පුරවැසියන් ලෙස සමාජයට දායාද කරවීමට මංපෙත් විවර කිරීම.

1:3 නාට්‍ය හා රංගකලාව පාසල් ප්‍රජාව අතර ජනප්‍රිය කරවීම හා වර්ධනය කිරීම.

1:4 ශිෂ්‍ය ශිෂ්‍යාවන් හා ගුරුභවතුන් සතු ගායන, වාදන, නර්තන හා අනුෂාංගික අංශයන් පිළිබඳව ඔවුන්ටම හඳුනාගැනීමට ඉඩ ප්‍රස්ථා සලසමින් හා සමාජ පිළිගැනීමක් ලබාදෙමින් නිර්මාණශීලීත්වය සහිත උසස් රසඥතාවයෙන් පිරි යහපත් පුරවැසි පිරිසක් බිහිකිරීමට අවශ්‍ය අඩිතාලම සැකසීම.

02 තරග ඉසව් :

මෙම උළෙලේ අංශ 03 ක් යටතේ ක්‍රියාත්මක වේ.

2:1 කෙටි නාට්‍ය
2:2 දිගු නාට්‍ය
2:3 නූර්ති නාට්‍ය ජවනිකා

03 ස්වභාවය :

3:1 ඉහත අංක 02 හි සඳහන් තරග අංශ සඳහා පහත සඳහන් කොන්දේසි හා නීති රීති වලංගු වේ.

3:1:1 කෙටි නාට්‍ය

3:1:1:1 ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ පෞරුෂ වර්ධනයට ඉවහල් වන්නාවූ අංක 01 යටතේ සඳහන් අරමුණු සාක්ෂාත් කෙරෙන, නිර්මාණශීලී අපූර්වත්වයකින් යුත්, ළමා මනසට ගෝචර, ස්වීය පිටපතකින් නිර්මාණය කෙරෙන නාට්‍යයක් විය යුතුය.

3:1:1:2 ළමා නාට්‍ය මේ සඳහා වලංගු නොවන අතර, කෙටි නාට්‍ය සංකල්පයට අනුව කළ රචනාවක් විය යුතුය.

3:1:1:3 සංවාද හා ගීත සඳහා භාවිතා කරන භාෂාව, අධ්‍යක්ෂණයෙහි යොදාගන්නා රංග උපක්‍රම හා ක්‍රමවේද උක්ත 3:1:1:1 අංකයෙහි සඳහන් කොන්දේසි අනුව සිදුකළ යුතුයි.

3:1:1:4 නාට්‍යයේ ධාවන කාලය විනාඩි 25 - 30 අතර විය යුතුයි.

3:1:1:5 මේ හැර පහතින් සඳහන් ව ඇති පොදු කොන්දේසි මේ සඳහා වලංගු වේ.

**3:1:2 දිගු නාට්‍ය**

3:1:2:1 ඉහත අංක 3:1:1:1 මේ සඳහා ද වලංගුය.

3:1:2:2 ළමා නාට්‍ය මේ සඳහා වලංගු නොවන අතර, දිගු නාට්‍ය සංකල්පයට අනුව කළ නාට්‍ය රචනාවක් විය යුතුය.

3:1:2:3 නාට්‍යයේ ධාවන කාලය විනාඩි 60 - 90 අතර විය යුතුය.

3:1:2:4 මේ හැර පහතින් සඳහන් ව ඇති පොදු කොන්දේසි මේ අංශය සඳහා වලංගු වේ.

**3:1:3 නූර්ති නාට්‍ය ජවනිකා**

3:1:3:1 පහතින් දක්වා ඇති නිර්දිෂ්ට කෘතියකින්, සංවාද හා ගීත සහිතව අඛණ්ඩව තෝරාගත් නාට්‍යමය ජවනිකා කොටසක් හෝ එකම නූර්තියක ගීත හා සංවාද සහිත ජවනිකා කීපයක් අර්ථයට හානි නොවන ලෙසට ඒකාබද්ධ කරමින් සකසා ගත් නාට්‍යමය ජවනිකා කොටසක් මේ සඳහා වලංගු වේ.

**3:1:3:1:1 නිර්දිෂ්ට ග්‍රන්ථ**

- නීතිඥ ජෝන් ද සිල්වා සූරීන්ගේ
  වෙස්සන්තර/ ශ්‍රී වික්‍රම/ සිරිසඟබෝ/ රාමායනය

- නීතිඥ චාල්ස් ඩයස් සූරීන්ගේ
  විධුර/ පද්මාවතී

3:1:3:2 ධාවන කාලය විනාඩි 25 - 30 අතර වේ.

3:1:3:3 ඉහත සඳහන් නිර්දිෂ්ට ග්‍රන්ථ හා ඒ ඒ නූර්ති වලට අදාළ සම්පූර්ණ ගීත සහිත සංයුක්ත තැටි පහසු මිලට ටවර් හෝල් රඟහල පදනමේ පොත් හලෙන් ලබාගත හැකිය.

3:1:3:4 නූර්ති නාට්‍ය සම්ප්‍රදාය ආරක්ෂා කරමින් මෙම නිෂ්පාදන ජවනිකා ඉදිරිපත් කළ යුතුය.

3:1:3:5 අයදුම් පත් එවීමෙන් අනතුරුව තම නූර්ති නාට්‍ය ජවනිකා නිර්මාණයෙහි නිෂ්පාදන කටයුතු ඇරඹීමට අවසර ඇත.

04 පොදු කොන්දේසි :

4:1 රජයේ පාසල්වල සිසුන්, පිරිවෙන් වල ඉගෙනුම ලබන සිසුන් හා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද පෞද්ගලික පාසල් වල සිසුනට සහ රජයේ පත්වීම් ලත් ගුරු භවතුන්ට මෙම තරගය සඳහා සහභාගී විය හැක.

4:2 මෙම තරගයට යම් පාසලක 01 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා සිසුන්ට සහභාගී වීමට හැකි අතර, එම විදුහල මගින් දෙවන වර උසස් පෙළ විභාගය සඳහා 2016 වර්ෂයේ දී පෙනී සිටින සිසුන්ට 2016.07.31 දින තෙක් සහභාගී විය හැකිය.

4:3 එක් පාසලකට තරග අංශ 03 සඳහාම ඉදිරිපත් විය හැකි අතර, එක් පාසලකින් එක් අංශයක් සඳහා ඉදිරිපත් කළ හැක්කේ එක් නාට්‍ය නිර්මාණයක් පමණි. චක්‍රලේඛය සමඟ අමුණා ඇති අයදුම්පත්‍රයේ ඡායා පිටපත් සකසා ගනිමින් තරග අංශ සඳහා වෙන වෙනම අයදුම් පත් යොමුකළ යුතුය.

4:4 ගායනය හා රංගනය නාට්‍ය ඉදිරිපත් කරන පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ම පමණක් විය යුතුය.

4:5 සංගීතය ඇතුළු අනුෂාංගික අංශ සඳහා පාසලේ ගුරු භවතුන් හෝ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහභාගී විය යුතුය. එහෙත් කිසියම් අනුෂාංගික අංශයක් සඳහා දායක කරගැනීමට තම පාසලේ ගුරු භවතෙක් හෝ ශිෂ්‍යයෙක්/ ශිෂ්‍යාවක් නොමැති නම්, ඒ සඳහා තම පළාතේ වෙනත් පාසලකින් ගුරු භවතෙක් හෝ සිසු සිසුවෙක් යොදා ගැනීමට අවසර ඇත. එහෙත් ඒ සඳහා පාසල් දෙකෙහිම විදුහල්පතිවරුන් විසින් අනුමත කළ ලිපියක්/ ලිපි පළාත් වටය ප්‍රදර්ශනයෙහිදී විනිශ්චය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. වෙනත් පාසලක ගුරුවරයෙකු හෝ ශිෂ්‍යයෙකු නොවන බාහිර ශිල්පීන් කිසිදු විටෙක අනුෂාංගික ශිල්පීය අවශ්‍යතාවන් සඳහා සහභාගී කරවා නොගත යුතුය.

4:6 නාට්‍ය පිටපත් රචනය හෝ අධ්‍යක්ෂණය සඳහා ගුරු භවතුන් ඉදිරිපත් වීම අපේක්ෂා කරන අතර, ඒ සඳහා පාසලේ ශිෂ්‍යයෙකු හෝ ශිෂ්‍යාවක ඉදිරිපත් වුවහොත් ඊට ද අවසර ඇත.

4:7 නාට්‍ය රචනය, අධ්‍යක්ෂණයේ සිට, වේදිකා පරිපාලනය, රංගනය, වාදනය, අනුෂාංගික අංග මෙහෙයවීම ආදී සියලුම ශිල්පීය දායකත්වය සහිතව නාට්‍යයක් සඳහා අතුළත් විය යුතු <u>උපරිම සංඛ්‍යාව (ගුරු භවතුන් හා සිසු සිසුවියන් සහිතව) 50 කි</u>. මෙහි අවමය සඳහා සීමාවක් නැත.)

4:8 නාට්‍යයක් සඳහා රංගන ශිල්පීන්ගේ සංඛ්‍යාවෙහි අවමය සඳහා සීමාවක් නැති අතර, උපරිමය ඉහත අංක 4.5 අනුව විය යුතුය.

4:9 මෙම තරගය සඳහා නිර්මාණය කරන සහ නිෂ්පාදනය කරන නාට්‍ය වල තේමා/ කතා වස්තූන්/ ගී පද මාලා/ දෙබස්/නාට්‍ය පෙළ ආදිය ජාති, ආගම්, කුල භේදවලට හා වෙනත් සමාජ විරෝධී අරමුණුවලට තුඩු නොදෙන එවැනි අදහස් ගම්‍ය නොවන ඒවා විය යුතු අතර, එවන් අදහස් ගම්‍ය වන පරිදි අර්ථකතනය නොකළ යුතු ද වේ. තවද, තමන් අයත් වන හෝ නියෝජනය කරන ජාති, ආගම්, සංස්කෘතික හා දේශපාලනික මතිමතාන්තර හේතුකොටගෙන කිසියම් සමාජ කොට්ඨාසයක් අපහසුවට ලක්විය හැකි ආකාරයේ ඉදිරිපත් කිරීම්වලින් වැළකිය යුතුය.

4:10 සියලු නිර්මාණයන් පාසල් සිසුනට උචිත, පාසල් පද්ධතියේ පිළිගත් වටිනාකම් හා නොගැටෙන ඒවා විය යුතු අතර අවර ගණයේ භාෂා ව්‍යවහාරයන්ගෙන් තොර විය යුතුය.

4:11 අයදුම්කරු හෝ අයදුම් පත්‍රයෙහි කිසියම් අංගයක් නියෝජනය කරන ගුරු භවතෙකු පත්‍රය එවීමෙන් පසු කවර හෝ හේතුවක් මත වෙනත් පාසලකට මාරු වී ඇත්නම් පාසල් දෙකෙහිම විදුහල්පතිවරුන්ගේ එකඟතාව මත තමන් කැමති පාසලකින් තම නිර්මාණය ඉදිරිපත් කිරීමට හෝ නිර්මාණයට දායකවීමට අවසර ඇත. ඒ පිළිබඳව විදුහල්පතිවරුන් දෙදෙනාගේම එකඟතාවන් ලිඛිතව අදාළ පාසලේ විදුහල්පති මගින් ටවර් හෝල් රඟහල පදනම වෙත දන්වා එවිය යුතුය.

4:12 මීට පෙර වර්ෂ වලදී මෙම තරගයෙන් ජයග්‍රහණ ලත් නාට්‍ය පිටපත් හෝ වෙනත් නාට්‍ය තරගයකින් ඉදිරිපත් කොට ජයග්‍රහණ ලත් නාට්‍ය පිටපතක් හෝ වංචනික ලෙස සොයා ගත් නාට්‍ය පිටපතක් හෝ අනුන්ගෙන් ලබාගෙන විකෘති කොට ඉදිරිපත් කරන ලද නාට්‍ය පිටපතක් හෝ මගින් කිසිදු තරග අංශයක් සඳහා නාට්‍ය නිර්මාණයක් ඉදිරිපත් කිරීම සපුරා තහනම් වේ. එවැනි නිර්මාණයක් තරගයට ඉදිරිපත් කොට ඇත්නම්, ඒ පිළිබඳව තොරතුරු අනාවරණය වූ වහාම කවර අවස්ථාවකදී හෝ වේවා එම නාට්‍යය උළෙලින් ඉවත් කෙරේ.

4:13 ටවර් හෝල් රඟහල පදනමේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ලබාගන්නා ලිඛිත අවසරයකින් තොරව මෙම උළෙලට ඉදිරිපත් කරන ලද නාට්‍ය පිටපත වෙනත් කිසිදු නාට්‍ය තරගයක් සඳහා ඉදිරිපත් කිරීමට අවසර නැත. ඉහත කී අවසරයකින් තොරව මෙම කොන්දේසි උල්ලංඝනය කළ බව සනාථ වුවහොත් එම නිර්මාණය උළෙලින් ඉවත් කෙරේ.

4:14 සෑම නාට්‍යයක්ම නියමිත දින නියමිත වේලාවට ප්‍රදර්ශනය කිරීමට අයදුම්කරුගේ වගකීම වන අතර, එසේ ප්‍රදර්ශනය කිරීමට අපොහොසත් වන නිර්මාණ ස්ව කැමැත්තෙන් තරගයෙන් ඉවත් කර ගත් ලෙස සළකා කටයුතු කරනු ඇත.

4:15 තරග සංවිධානය, විනිශ්චය මණ්ඩලය පත්කිරීම හා විනිශ්චයන් පිළිබඳ මතුවන සියලු ගැටලු සම්බන්ධයෙන් සංස්කෘතික කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය හා අධ්‍යාපන අමාත්‍යාංශය සම්පූර්ණයෙන් ම වගකීමෙන් නිදහස් වන අතර, තරගයේ කොන්දේසි උල්ලංඝනය කිරීම සම්බන්ධව හෝ උළෙල සංවිධාන කටයුතු පිළිබඳ සියලු තීරණ ගැනීමේ වගකීම ටවර් හෝල් රඟහල පදනම සතු බව අයදුම්කරු අවිවාදයෙන් ම පිළිගත යුතුය.

4:16 මෙම තරගයට අයදුම් කොට ඉදිරිපත් වන සියලුම පාසල් හා අනෙකුත් අදාළ පාර්ශවකරුවන් සෑම අවස්ථාවකදීම මෙම චක්‍රලේඛයේ සඳහන් සියලුම නීති රීති හා විධිවිධාන අනිවාර්යයෙන් ම පිළිපැදීමට බැඳී සිටින බවටත්, ඇගයීම් මණ්ඩලයේ ඕනෑම තීරණයක් කොන්දේසි විරහිතව පිළිගැනීමට බැඳී සිටින බවටත් සලකනු ලැබේ.

4:17 සංවිධාන කටයුතුවලට බාධා පැමිණෙන අයුරින් හෝ වෙනත් නුසුදුසු ක්‍රියාවන් සිදුකරමින් හෝ හැසිරෙන ගුරුවරුන් හා සිසුන් වෙතොත් ඔවුනට එරෙහිව විනයානුකූලව පියවර ගනු ලැබේ.

4:18 යම් පාසලක් අයදුම්පත් එවීමේදී ම විනිශ්චය පිළිගැනීමට බැඳී සිටින බැවින්, විනිශ්චය පිළිබඳ අභියාචනා ඉදිරිපත් නොකළ යුතු අතර, එවන් අභියාචනා භාර නොගැනේ.

4:19 ප්‍රසිද්ධ කටයුත්තක් නොව, අධ්‍යාපන අමාත්‍යාංශයේ හා ටවර් හෝල් රඟහල පදනමේ අභ්‍යන්තර රාජකාරියක් වන මෙම තරගයේ මොනම අවස්ථාවකදීවත් තම පාසලේ කටයුතු ආවරණය කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ අවසරයෙන් තොරව ජනමාධ්‍යවේදීන් හෝ ඡායාරූප ශිල්පීන් කැඳවාගෙන ඒම තහනම් වේ.

4:20 ප්‍රාදේශීය අදියර වල කාල සටහන් ලබාදීම, කොළඹදී පැවැත්වෙන පූර්ව උපදෙස් රැස්වීමකදී සිදුකෙරෙනු ඇති බැවින් ඊට සහභාගී වීම අනිවාර්ය වේ. එම රැස්වීමේ දී ලබාදෙන ''විදුහල්පති විශේෂ ප්‍රකාශය'' නම් ආකෘති පත්‍රය තම නාට්‍යය වේදිකාගත කිරීමට පෙර, විදුහල්පතිගේ අත්සන සහිතව අනිවාර්යයෙන්ම ලබාදිය යුතුය. එමෙන් ම එම රැස්වීමට සහභාගී නොවන පාසල් තරගයට ඉදිරිපත් නොව සේ සලකා කටයුතු කෙරේ.

4:21 විනිශ්චය මණ්ඩලයෙහි තීරණ, අවසාන හා තීරණාත්මක වේ.

05 තරගය පැවැත්වෙන ආකාරය :

5:1 I අදියර - අයදුම්පත් කැඳවීම

5:1:1 පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ සෞන්දර්යය අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් හෝ අයදුම්පත් සහිත චක්‍රලේඛය බෙදා හැරේ. ඊට අමතරව අධ්‍යාපන අමාත්‍යාංශයේ **www.moe.gov.lk** වෙබ් අඩවියෙන් හා ටවර් හෝල් රඟහල පදනමෙහි **www.towerhall.lk** මගින් චක්‍රලේඛ හා අයදුම්පත් ලබාගත හැකිය.

5:1:2 පහත සඳහන් ලිපිනයට අයදුම්පත් එවිය යුතු අතර, අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2015 මැයි 15 වේ.

**අධ්‍යක්ෂ ජනරාල්, ටවර් හෝල් රඟහල පදනම, ''සව්සිරිපාය'',**
**අංක 123, විජේරාම මාවත, කොළඹ 07.**

5:1:3 සෑම අයදුම්පතක් සමඟම තම පාසලට පැමිණෙන මාර්ග සිතියම පැහැදිලි රූප සටහනක් මගින් (හැකිනම් දුර ප්‍රමාණයද සටහන් කොට) එවිය යුතුය.

5:1:4 අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පසුව එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

5:2 II අදියර - පිටපත් රචනය පිළිබඳ සම්මන්ත්‍රණය හා පූර්ව දැනුවත් කිරීමේ වැඩසටහන

5:2:1 අයදුම්පත් එවන ලද නාට්‍ය වල අධ්‍යක්ෂක, නාට්‍ය රචක හා නූර්ති නාට්‍ය වල සංගීත අධ්‍යක්ෂක මෙම වැඩ සටහනට කැඳවනු ලබයි.

5:2:2 මෙය එක්දින වැඩසටහනකි.

5:2:3 <u>මෙම වැඩසටහනින් පසු සියලුම නාට්‍යයන්හි නිෂ්පාදන කාර්යයන් ආරම්භ කිරීමට ඒ ඒ නිර්මාණවල අධ්‍යක්ෂවරයාට අවසර ඇති අතර, ඒ අනුව ක්‍රියාත්මක විය යුතුය.</u>

5:3 III අදියර - පළාත් වටයේ තරග විනිශ්චය

5:3:1 පළාත් තරග වටය සඳහා තරග අංශ තුන යටතේ ඉදිරිපත් කෙරෙන නිර්මාණ විනිශ්චය කිරීම මෙහිදී සිදුකෙරේ. ඒ සඳහා වෙන් වෙන් වශයෙන් ඒ ඒ පාසල් වෙත ගොස් හෝ එක් දිස්ත්‍රික්කයක තෝරාගත් එකම මධ්‍යස්ථානයකදී ඒ දිස්ත්‍රික්කයට අයත් නාට්‍ය නිර්මාණ විනිශ්චය කිරීම මගින් හෝ පළාත් වටයේ විනිශ්චය සිදුකෙරේ.

5:3:2 පළාත් වටයේ විනිශ්චය මගින් අවසාන වටයට සුදුසු නාට්‍ය තෝරාගනු ලබයි.

5:3:3 තරගය සඳහා ඉදිරිපත් වීමට අයදුම්පත් එවන ලද නාට්‍ය නිෂ්පාදකවරුන් සඳහා පැවැත්වෙන පූර්ව දැනුවත් කිරීමෙන් පසු මෙම චක්‍රලේඛයෙහි 3:1:3:5 හා 5:2:3 යටතේ සඳහන් ව ඇති ආකාරයට තම නාට්‍යයේ නිෂ්පාදන කටයුතු ආරම්භ නොකොට කිසිදු පූර්ව සැලසුමකින් හා පූර්ව දැනුම් දීමකින් සහ මනා පුහුණු වීමකින් තොරව නොසැලකිලිමත් ලෙස කටයුතු නොකළ යුතු බව අවධාරණය කෙරේ. එවන් කටයුතුවලින් නිකරුණේ රජයේ මුදල් නාස්ති වීමත් විනිශ්චය මණ්ඩලය සහ මෙම තරගය සංවිධානය කරනු ලබන ටවර් හෝල් රඟහල පදනම අපහසුවට පත් වීමත් සිදු වුවහොත් ඒ සඳහා අදාල විදුහලේ විදුහල්පති සහ එම නාට්‍යයට අයදුම්පත් එවූ ගුරු භවතුන් වගකීමට බැඳේ. තම නිර්මාණය ඉදිරිපත් කිරීමේ අවසාන වගකීම අදාල විදුහලේ විදුහල්පතිවරයා සතු වන අතර ආයතනයට බලපාන නොවැලැක්විය හැකි හේතුවක් මත තම නිර්මාණය ඉදිරිපත් කළ නොහැකි නම් ඒ බව කල් තබා විධිමත්ව ටවර් රඟහල පදනමට මෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යක්ෂවරයා වෙත ද දැනුම් දිය යුතු වේ.

5:3:4 පාසලකට මෙම චක්‍රලේඛයේ උපදෙස් පරිශීලනය කිරීමට නොහැකිවීම හෝ නොකිරීම නිදහසට කරුණක් නොවේ. ඉන් දරුවන්ට සිදුවිය හැකි සහ රජයට සිදුවිය හැකි හානි, නොසැලකිලිමත් බවේ හා වගකීම් විරහිත බවේ ප්‍රතිඵලයක් සේ සළකා අදාළ වගකිව යුතු පාර්ශවයන්ට විරුද්ධව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පියවර ගනු ලැබේ.

5:3:5 ඉහත 5:3:3 කොන්දේසිය අනුව කිසියම් සුවිශේෂී හේතුවක් මත තම නාට්‍යය පළාත් වටයේ විනිශ්චය සඳහා ඉදිරිපත් කිරීමට නොහැකි නම්, ඒ බව පාසලේ විදුහල්පතිගේ නිර්දේශයක් ද සහිතව ටවර් හෝල් රඟහල පදනමට දින 10 කට පෙර ලැබීමට හැකි වන ලෙස ටවර් හෝල් රඟහල පදනමේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපියක් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එහි පිටපතක් අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්යය ඒකකයේ අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද යැවිය යුතුය.

5:3:6 පළාත් වටය සඳහා ඉදිරිපත් වන නිර්මාණවල කුසලතා දක්වන ගුරුභවතුන් හෝ සිසු සිසුවියන් සඳහා පමණක් සහතික පත් ප්‍රදානය කෙරේ.

5:3:7 පළාත් වටයේ ප්‍රදර්ශනයකදී තම නාට්‍ය සඳහා ප්‍රේක්ෂක සහභාගීත්වය සළසා ගැනීමට අයදුම්කරුට අවකාශ ඇත.

5:3:8 පළාත් වටයෙහිදී විනිශ්චය මණ්ඩලය සඳහා පහත සඳහන් ලේඛන භාරදිය යුතුය.

5:3:8:1 ඉදිරිපත් කරන නාට්‍ය වල පිටපත් A 4 කඩදාසි වල, සම්මත නාට්‍ය පිටපත් ආකෘතියට අනුව පිටුවේ අවකාශය බෙදා ගනිමින්, පොයින්ට් 12 අක්ෂර ප්‍රමාණයෙන් පරිගණක යතුරු ලියනය කොට තිබීම අනිවාර්ය වේ. එසේ නොඑවන පිටපත් ප්‍රතික්ෂේප කෙරේ.

5:3:8:2 නූර්ති නාට්‍ය ජවනිකාවක් සඳහා තමා විසින් තෝරාගත් කොටසෙහි ඡායාස්ථිති පිටපත් 01 ක් භාරදීම.

5:3:8:3 නාට්‍යයට සහභාගීවන සියලුම සිසුන්ගේ නම් හා උපන්දිනයන් සහිතව සහ ගුරු භවතුන්ගේ නම් සහිතව විදුහල්පති විසින් අත්සන් කරන ලද ලේඛනයක් ඉදිරිපත් කිරීම.

5:3:9 පළාත් වටයේ තරඟ විනිශ්චය 2015 සැප්තැම්බර් අවසාන සතියේ සිට නොවැම්බර් මුල් සතිය දක්වා කාලය අතරතුර සතිඅන්ත හා නිවාඩු දිනවලදී පැවැත්වේ.

5:3:10 විනිශ්චය මණ්ඩලය ටවර් හෝල් රඟහල පදනම විසින් තෝරාපත් කරනු ලබන අතර, විනිශ්චය මණ්ඩලයේ තීරණ අවසාන තීරණය වේ.

5:3:11 පළාත් වටයේ තරගවලට ඉදිරිපත් වල සෑම නිර්මාණයක් ම නියමිත දින නියමිත වේලාවට ඉදිරිපත් කිරීමට අයදුම්කරු වගබලා ගත යුතු අතර, නියමිත වේලාවට වඩා ප්‍රමාදයක් යටතේ ඉදිරිපත් කරන ලද නාට්‍ය උළෙලින් ප්‍රතික්ෂේප කිරීමට විනිශ්චය මණ්ඩලයට අවසර ඇත.

**5:4 IV අදියර - අවසාන වටයට තෝරාගත් නාට්‍ය වල අධ්‍යක්ෂවරුන් සඳහා තෙදින වැඩමුළුව**

5:4:1 මෙම වැඩමුළුව තෙදින නේවාසික වැඩමුළුවක් වන අතර කොළඹ දී පැවැත්වේ.

5:4:2 අවසාන වටයට තෝරාගත් නාට්‍ය වල අධ්‍යක්ෂවරුන් හා එක් නාට්‍යයක එක් අනුෂාංගික අංශයට ඉදිරිපත් වූ ගුරු භවතෙක් වශයෙන් එක් නාට්‍යයකින් දෙදෙනෙක් සඳහා වැඩමුළුව පැවැත්වේ.

5:4:3 2015 වසරේ අවසාන වාරයේ පාසල් නිවාඩුව ලබාදීමට පෙර මෙම වැඩමුළුව පැවැත්වීමට නියමිතය.

5:4:4 නාට්‍ය රචනය, අධ්‍යක්ෂණය, සංගීතය ඇතුළු අනුෂාංගික අංශ කෙරෙහිත් පළාත් වටයේ දී නිර්මාණවලින් ප්‍රකට වූ දුර්වලතා කෙරෙහිත් අවධානය යොමුකිරීම මෙහිලා ප්‍රමුඛ ව සිදුවේ.

**5:5 V අදියර - අවසාන වටයට තෝරා නොගත් පළාත් වටයෙහි ප්‍රදර්ශිත නාට්‍ය වල අධ්‍යක්ෂවරුන් සඳහා පැවැත්වෙන දෙදින වැඩමුළුව**

5:5:1 පළාත් වටයට ඉදිරිපත් වී අවසාන වටයට සුදුසුකම් නොලත් නාට්‍ය වල අධ්‍යක්ෂවරුන් සඳහා මෙම වැඩමුළුව පැවැත්වේ.

5:5:2 මෙම වැඩමුළුව සංවිධානය කෙරෙනුයේ ඒ සඳහා පළාත් වටයෙන් ප්‍රතික්ෂේපිත නාට්‍ය වල අධ්‍යක්ෂවරුන් 50% වැඩි සහභාගීත්වයක් දරන්නේ නම් පමණි.

5:5:3 2015 දෙසැම්බර් පාසල් නිවාඩුව ලබාදීමට පෙර කොළඹදී පැවැත්වෙන නේවාසික වැඩමුළුවකි.

5:5:4 2016 වසර සඳහා නාට්‍ය ඉදිරිපත් කිරීමට උනන්දු කිරීමටත්, පළාත් වටයෙහි දී නාට්‍ය නිර්මාණවල දැක්වූ දුර්වලතා හඳුන්වාදීම හා ඒ පිළිබඳව අවබෝධය ලබාදීමත් මෙහිලා මුඛ්‍ය අරමුණ වේ.

**5:6 VI අදියර - අවසාන වටය**

5:6:1 2016 ජනවාරි - පෙබරවාරි මාසවල කොළඹ දී පැවැත්වීමට නියමිතය.

5:6:2 පළාත් වටයෙහිදී ඉදිරිපත් කරන ලද නාට්‍ය අතරින් අවසාන වටයට සුදුසුකම් ලත් නාට්‍ය මේ සඳහා තෝරාගැනෙන අතර, ඒ ඒ අංශය යටතේ තෝරා ගැනීමට නියමිත සංඛ්‍යාව පළාත් වටයෙහිදී ඉදිරිපත් කරන ලද නිර්මාණවල ගුණාත්මක තත්වය මත සිදුවේ.

5:6:3 මෙම උළෙලට ඉදිරිපත් වන සියලුම නාට්‍ය නියමිත දින නියමිත වේලාවට ම ප්‍රදර්ශනය කිරීමට නාට්‍ය අධ්‍යක්ෂවරයාගේ සම්පූර්ණ වගකීම වන අතර, මෙම කොන්දේසිය උල්ලංඝනය කරන නාට්‍ය අවසාන වටයෙන් ප්‍රතික්ෂේප වේ.

5:6:4 අවසාන වටයට ඉදිරිපත් වන නාට්‍ය වල නාට්‍ය අධ්‍යක්ෂවරු සඳහා රු. 5000.00 ක දීමනාවක් ද, දුර ප්‍රමාණය අනුව කිසියම් සහනදායී ප්‍රවාහන දීමනාවක් ද ලබාදෙනු ඇත.

5:6:5 කොන්දේසි 4:5 ප්‍රකාරව සෑම නාට්‍යයක් සඳහාම සහභාගී වන පිරිසට කෙටි ආහාර පාර්සලයක් ලබාදීමට නියමිතය.

5:6:7 අවසාන වටයේ තරගය නොමිලයේ නැරඹීමට හැකි බැවින්, ඒ සඳහා ඔබ පාසලේ සිසු සිසුවියන් සහභාගී වන්නේ නම්, ඔවුන්ගේ විනය හා හැසිරීම පිළිබඳව සැලකිලිමත්වීමට වගබලා ගත යුතුය.

5:6:8 විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

**5:7 VII අදියර - තිළිණ හා සම්මාන ප්‍රදානය**

5:7:1 තිළිණ හා සම්මාන ප්‍රදානය 2016 මාර්තු/ අප්‍රේල් මාසයේ දී පැවැත්වීමට නියමිතය.

5:7:2 තිළිණ හා සම්මාන උළෙල සඳහා සහභාගී වන සිසු සිසුවියන් පාසල් නිල ඇඳුමින් ද ගුරු භවතුන් උත්සවයේ ගෞරවය රැකෙන පරිදි සුදුසු ඇඳුමකින් ද සැරසී පැමිණීම අනිවාර්ය වේ.

5:7:3 අවසාන වටයේ දී විශේෂ කුසලතා ප්‍රකට කරන ගුරු භවතුන් හෝ සිසු සිසුවියන් සඳහා සහතික පත් ප්‍රදානය කෙරේ.

5:7:4 අවසාන වටයට ඉදිරිපත් වූ නාට්‍ය වලට අයත් සෑම ගුරු භවතෙක් හා සිසු සිසුවියක් සඳහා ම සහභාගීත්ව සහතිකයක් ප්‍රදානය කෙරේ.

5:7:5 සමස්ත ලංකා පාසල් නාට්‍ය තරගයේ ජයග්‍රාහකයින් සඳහා පහත සඳහන් පරිදි තිළිණ හා සම්මාන පිරිනැමේ.

| තරග අවස්ථාව | නූර්ති ප්‍රවනිකා | කෙටි නාට්‍ය (ඒකාංක) | දිගු නාට්‍ය |
|---|---|---|---|
| හොඳම සංගීත අධ්‍යක්ෂණය | රු: 10,000/- | රු: 5,000/- | රු: 7,500/- |
| හොඳම වේදිකා පසුතල නිමැවුම | රු: 10,000/- | රු: 5,000/- | රු: 7,500/- |
| හොඳම රංග වස්ත්‍ර නිර්මාණය | රු: 10,000/- | රු: 5,000/- | රු: 7,500/- |
| හොඳම අංග රචනය | රු: 10,000/- | රු: 5,000/- | රු: 7,500/- |
| හොඳම සහාය රංගනය (නිළි) | රු: 10,000/- | රු: 10,000/- | රු: 10,000/- |
| හොඳම සහාය රංගනය (නළු) | රු: 10,000/- | රු: 10,000/- | රු: 10,000/- |
| හොඳම රංගනය (නිළි) | රු: 15,000/- | රු: 15,000/- | රු: 15,000/- |
| හොඳම රංගනය (නළු) | රු: 15,000/- | රු: 15,000/- | රු: 15,000/- |
| හොඳම පිටපත 3 ස්ථානය | - | රු: 7,500/- | රු: 15,000/- |
| හොඳම පිටපත 2 ස්ථානය | - | රු: 10,000/- | රු: 20,000/- |
| වසරේ හොඳම පිටපත | - | රු: 15,000/- | රු: 25,000/- |
| වසරේ හොඳම අධ්‍යක්ෂණය | රු: 20,000/- | රු: 15,000/- | රු: 25,000/- |
| හොඳම නිෂ්පාදනය 3 ස්ථානය | රු: 20,000/- | රු: 15,000/- | රු: 20,000/- |
| හොඳම නිෂ්පාදනය 2 ස්ථානය | රු: 25,000/- | රු: 20,000/- | රු: 25,000/- |
| වසරේ හොඳම නිෂ්පාදනය | රු: 30,000/- | රු: 25,000/- | රු: 30,000/- |

උපාලි මාරසිංහ
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය
අධ්‍යාපන අමාත්‍යාංශය
ටවර් හෝල් රඟහල පදනම

# සමස්ත ලංකා පාසල් නාට්‍ය තරගය - 2015

නූර්ති ප්වනිකා/ කෙටි නාට්‍ය (ඒකාංක)/ දිගු නාට්‍ය

## අයදුම් පත්‍රය

තරග අංශය :..........

නාට්‍යයේ නම :..........

පාසලේ නම :..........

පළාත :.......... දිස්ත්‍රික්කය :..........

01 අයදුම්කරුගේ නම :.......... මයා/ මිය

ජාතික හැඳුනුම් පත් අංකය : ..........

ලිපිනය : ..........

..........

දුරකථන අංකය : නිවස .......... ජංගම ..........

02 පිටපත් රචකයාගේ නම :.......... මයා/ මිය

ජාතික හැඳුනුම් පත් අංකය : ..........

ලිපිනය : ..........

..........

දුරකථන අංකය : නිවස .......... ජංගම ..........

03 අධ්‍යක්ෂවරයාගේ නම :.......... මයා/ මිය

ජාතික හැඳුනුම් පත් අංකය : ..........

ලිපිනය : ..........

..........

දුරකථන අංකය : නිවස .......... ජංගම ..........

04 සංගීත අධ්‍යක්ෂවරයාගේ නම :.......... මයා/ මිය

ජාතික හැඳුනුම් පත් අංකය : ..........

ලිපිනය : ..........

..........

දුරකථන අංකය : නිවස .......... ජංගම ..........

05 පාසලේ ලිපිනය : ..............................................................................................

..............................................................................................

දුරකථන අංකය : ..............................................................................................

06 කලාප අධ්‍යාපන කාර්යාලය හා ලිපිනය : ..............................................................................................

..............................................................................................

දුරකථන අංක : ..............................................................................................

07 පාසලේ සිට ආසන්නතම ප්‍රධාන නගරය : ..............................................................................................

08 ප්‍රධාන නගරයේ සිට පාසලට දුර : ..............................................................................................

ඉහතින් දක්වා ඇති තොරතුරු මාගේ දැනුමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බවත් මෙම තරගාවලියට අදාළ කොන්දේසි වලට අනුකූලව මෙම නූර්ති ජවනිකාව/ නාට්‍ය නිර්මාණය ඉදිරිපත් කරනු ලබන බවත්, මෙම පිටපත වෙනත් කවර හෝ අයෙකු විසින් මීට පෙර රචනා කරන ලද්දක් හෝ අධ්‍යක්ෂණය කරන ලද්දක් හෝ ශ්‍රී ලංකාවේ කුමන හෝ නාට්‍ය තරගයකට කුමන මට්ටමකින් හෝ ඉදිරිපත් කළ නූර්ති ජවනිකාවක්/ නාට්‍යයක් නොවන බව ස්ථිර කර ප්‍රකාශ කර සිටින අතර, ඉහත සඳහන් කරන ලද කුමන හෝ කරුණක් අසත්‍ය යැයි මෙම නාට්‍ය තරගාවලියේ කුමන හෝ අවස්ථාවක හෙළිදරව් වුවහොත්, ඉහත කී නූර්ති ජවනිකාව/ නාට්‍ය මෙම තරගාවලියෙන් ඉවත් කිරීමට ටවර් හෝල් රඟහල පදනමට ඇති අයිතිය පිළිගන්නා බවත්, මෙම නාට්‍ය තරගාවලියේ දී විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය ලෙස අවිවාදයෙන් පිළිගන්නා බවත්, මෙම නූර්ති ජවනිකාවට/ නාට්‍යයට සම්බන්ධ සියළුම ශිල්පීන් අදාළ කොන්දේසි අනුව තෝරාගත් අය බවත්, මෙම නිර්මාණය සඳහා රංගනයෙන් දායකවන සියළුදෙනාම මෙම පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් බවත් සහතික කර ප්‍රකාශ කර සිටිමි.

| | |
|---|---|
| ...................................................... | .......................................................................................... |
| දිනය | අයදුම්කරුගේ අත්සන |

ඉහත සඳහන් චක්‍රලේඛයේ සඳහන් කොන්දේසි වලට අනුකූලව මෙම නූර්ති ජවනිකාව/ නාට්‍ය, නිර්මාණය කර ඇති බවත්, මෙම නිර්මාණයේ රංගනය සඳහා දායක වන සියළුම සිසු සිසුවියන් මෙම පාසලේ ඉගෙනුම ලබන අය බවත්, ඉහත අයදුම්කරු/ කාරිය, නාට්‍යයේ රචක හා අධ්‍යක්ෂක මෙම පාසලේ ගුරු මණ්ඩලයේ අය බවත්, අයදුම්පත මාගේ පූර්ණ අනුමැතිය මත ඉදිරිපත් කරන බවත්, නූර්ති ජවනිකාව/ නාට්‍ය නිර්මාණය කර ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය හා අනුග්‍රහය ලබාදෙන බවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

| | | |
|---|---|---|
| .................................. | ..................................................... | ........................................................... |
| දිනය | විදුහල්පතිගේ/ විදුහල්පතිනියගේ නම | විදුහල්පතිගේ/විදුහල්පතිනියගේ අත්සන |
| | නිල මුද්‍රව | |